# පැරණි ලංකාවේ පොත්ගුල් සේවාවේ ඓතිහාසික පසුබිම

- ආචාර්ය ආර්. එච්. අයි. එස්. රණසිංහ -

**සාරාංශය**

ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දහවන සියවස තෙක් විහිදී යන අනුරාධපුර යුගය පැරණි ලංකාව ලෙස සලකනු ලැබේ. එම යුගයේ දියුණු පොත්ගුල් සේවාවන් වූ බව ඓතිහාසික මූලාශ්‍ර මගින් සනාථ වේ. එවැනි සේවාවන් සඳහා මනාවින් සංවිධානය වූ අධ්‍යාපන පද්ධතියක් තිබීම අවශ්‍ය වේ. සෑම රටක ම මෙන් ම එවැනි තත්ත්වයකට පසුබිම සකස් වනුයේ දියුණු ආගමික සම්ප්‍රදායයන් මගිනි. ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ දේවානම්පියතිස්ස රජ සමයේ දී, මිහිඳු හිමි මෙරටට බුදුදහම හඳුන්වා දීම, සිංහල ශිෂ්ටාචාරය නව මඟකට යොමු කිරීමට සමත් විය. බුදුසසුන මෙරට ප්‍රතිෂ්ඨාපනය වීමත් සමඟ බෞද්ධ අධ්‍යාපනය ආරම්භ විය. ධාරණ ශක්තිය වර්ධනය වනසේ සැකසී තිබූ අධ්‍යාපන රටාව හේතුවෙන් බුදුදහම අන්තර්ගත ත්‍රිපිටකය වචන මාර්ගයෙන් ක්‍රිස්තු පූර්ව පළමුවන සියවස දක්වා රැගෙන ඒමට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට හැකි විය.

ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සහ එම ග්‍රන්ථ විහාරාරාමයන්හි සහ පිරිවෙන්හි තැන්පත් කිරීම පොත්ගුල්වල ආරම්භය ලෙස සලකනු ලැබේ. එවකට ප්‍රධාන නිකායන් වූ මහාවිහාර සහ අභයගිරියෙහි පැවති අධ්‍යාපන පාඨමාලා සඳහා ලියැවුණු ග්‍රන්ථ මෙන් ම මෙරට පොත්ගුල් පරිශීලනය සඳහා පැමිණි විදේශීය පඬිවරුන් ලියන ලද අටුවා සහ ග්‍රන්ථාවලින් ද පොත්ගුල් සම්භාවිත විය. බුදු දහමින් පෝෂිත ආගමික සහ සාහිත්‍ය ප්‍රබෝධය සමඟ අනුරාධපුර යුගයේ සිංහල, පාලි සහ සංස්කෘත භාෂාවලින් ග්‍රන්ථ සම්භාරයක් ලියැවී ඇත. ධර්ම ග්‍රන්ථ රචනයෙන් සහ කියවීමෙන් ලෙඩ්වැඩ සිදුවන බවට වූ පිළිගැනීම අනුව ග්‍රන්ථ රචනය සඳහා බොහෝ දෙනා පෙළඹී ඇත. මහාවිහාර, අභයගිරි සහ ජේතවන නිකායන් සම්බන්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයන්ට අනුබද්ධව පොත්ගුල් රාශියක් දිවයින පුරා පැවතුණි. එවකට පොත්ගුල් මගින් ග්‍රන්ථ තැන්පත් කිරීම, ආරක්ෂා කිරීම පමණක් නොව, විශේෂ සේවාවන් රාශියක් ද ඉටුවිය. විශේෂ නීති පද්ධතියකට අනුව පරිශීලනය සඳහා ඉඩ දීම, වෙනත් නිකායිකයින්ට ද, විදේශිකයින්ට ද පරිශීලනය

සඳහා ඉඩ දීම, ග්‍රන්ථ පිටපත් කිරීම, දේශීය හා විදේශීය වංශයන් බෙදා හැරීම ආදිය ප්‍රධාන සේවාවන් විය.

බෞද්ධ අධ්‍යාපනයේ භාරකරුවන් ලෙස ක්‍රියාකළා වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් පොත්ගුල් වර්ධනය සඳහා මහත් දායකත්වයක් ලැබුණි. බෞද්ධ අධ්‍යාපනයේ මෙන් ම, ග්‍රන්ථ රචනයේ ද පුරෝගාමීන් වූ භික්ෂූන් වහන්සේලා පොත්ගුල්වල භාරකරුවන් ලෙස ක්‍රියාකරමින් විශේෂ මෙහෙයක් ඉටු කළහ. එසේ ම සිංහල රජවරුන්ගෙන් පොත්ගුල් ආරම්භයට මෙන් ම වර්ධනයට මහත් දායකත්වයක් ලැබුණි. ත්‍රිපිටකය පිටපත් කරවීම, ග්‍රන්ථ රචක භික්ෂූන්ට සිව්පසයෙන් උපස්ථාන කිරීම, ගිහි ග්‍රන්ථ රචකයන්ට පඩුප් ගෙවීම සහ දීමනා දීම, ග්‍රන්ථ රචනය සහ රාජකීය පොත්ගුල් පවත්වාගෙන යාම ආදිය ඒ අතුරින් ප්‍රධාන සේවාවන් විය.

ශ්‍රී ලංකාවේ උසස් ලේඛන සම්ප්‍රදායකට හා ග්‍රන්ථකරණයට මෙන් ම, පොත්ගුල් බිහිවීමට ද හේතු සාධක වූ බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භය බුදුසසුන මෙරට මුල් බැස ගැනීමත් සමග බැඳී පවතී. මෙරටට බුදුදහම හඳුන්වාදීමත් සමග දේවානම්පිය තිස්ස රජු ඇතුළු දහස් ගණන් ජනතාව බුදුදහම වැළඳ ගත්හ. එසේ වුව ද බුදුසසුන මෙරට ප්‍රතිෂ්ඨාපනය වනුයේ මෙරට මව්පිය දෙදෙනකුට දාව, මෙහිදී උපත ලැබූවකු මෙහිදී විනය උගෙන, මෙහිදීම විනය උගැන්වීමෙන් පසුව බව මිහිඳු මාහිමි දැන්වීය. ඒ අනුව, එයට සුදුසු වූ අරිට්ඨ හිමි විනය උගෙන, ථූපාරාමයේ දී විනය උගැන්වීමත් සමග බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භය ද ඇතිවිය. (විනයවිවෘති නම් වූ සිංහල සමන්තපාසාදිකාව, 1975)